චෛත්‍යයට හැඩරුව ගත්ත ඒ චෛත්‍යය අපේ පැරැන්නෝ කරපු හැටි ගැනයි, විශාලත්වය ගැනයි අදහසක් ගන්න. දැන් අපේ අය මේ වැඩේ කළේ කොහොමද කියලා බලමු.

ඇත්තටම ජේසා වළලු තුනට පහතින් තියෙන කොටස කවාකාර රවුමක් විදියට නෙවෙයි උසින් බැලුවම ජේන සැලැස්මට තියෙන්නේ. පැති අටක් තියෙන බහු අස්‍රයක්. අපි මේ කොටස පාදම (Base) කියලා කියමු. මේ පාදමට අත්තිවාරම (Foundation) මීටර් 1.2 ක්; ඒ කියන්නේ අඩි හතරක් විතර යටට කපන්න සැලසුම් කරලයි තිබුණේ. පසේ බර දරා ගන්න පුළුවන් ශක්තිය පරීක්ෂා කරලා බලපුවාම ඒ ගානට අත්තිවාරම කැපුවම ඇතියි කියලා තීරණය කරපු බවයි මෙන්ඩිස් මහත්තයා කිව්වේ. අෂ්ටාශ්‍රයේ පැති අට එක දිගට යැවෙන තීරුවක් වගේ අත්තිවාරම දමන්න (Strip Footing) අත්තිවාරම් අගල (Foundation trench) කැපුවා. කිලෝ පැස්කල් 150ක (150 kpa) දරා ගැනීමේ හැකියා-වක් (bearing capacity) තියෙන ''පී'' (P) ශ්‍රේණියේ (Class P) අත්තිවාරමකුයි දැම්මේ. ඕන කරන විදියට කම්බි කූඩුවක් බැඳලා හරියට ඒ අත්තිවාරම් කානුවේ තැන්පත් කරලා හොඳටම ඔරොත්තු දෙන අඩි බලය තියෙන කොන්ක්‍රීට්වලින් තමයි (High Strength Durable Concrete) මිටරයක් පළලට කැපුණ කාණුවේ මීටර් 0.6ක් උසට තීරු අත්තිවාරම (Strip Footing) දැම්මේ.

මීට අමතරව උඩින් බලපුවාම දකින සැලැස්මේ අෂ්ටාශ්‍රය හරිමැද්දද; නැත්නං කේන්ද්‍රයේ ඉඳන් නැවත කුඹ ගහක් වගේ ඉහළට නගින කණුවකුත් හදන්නයි සැලසුම් කළේ. මේ කනුව හැදුවෙ අඩි 2ක් (මීටර් 0.6) විෂ්කම්භය තියෙන පයිප්ප කෙලින් අතට එක පිට එක තියලා ඒ මැද්දට මිලි මීටර් 24 දගර වානේ කම්බි 5ක් බිම ඉඳන් ඉහළට මැදින් දාලා ඒවා අනුවෙන්න අර කලින් තියපු කොන්ක්‍රීට් දාලයි. මේ කණුව මධ්‍ය දණ්ඩක් වගේ (Shaft) දේවතා කොටුව මට්ටමට ම ඉහළ නැංවුණා. කණුවටත් කෙරුණෙ අර කලින් කිව්ව විදියෙම අත්තිවාරමක්. ඒත් කණුවේ අත්තිවාරම මීටර් 1.5 හේ මීටර් 1ග.5 හේ සමචතුරස්‍රාකාර මීටර් උස කොන්ක්‍රීට් තට්ටුවක් (pad footing) සැලැස්මට අනුව උඩින් බලපුවම මේ කොටුවෙ කොන් හතරින් අර මුලින් කිව්ව අෂ්ටාශ්‍රයට දුවන තවත් තීරු අත්තිවාරම් කොටස් හතරක් මැද්දේ ඉඳන් අරියව (radially) සම්බන්ධ වෙනවා. අෂ්ටාශ්‍රයේ අත්තිවාරම උඩ බිත්ති බැඳුනේ බ්ලොක් ගල්වලින්. බ්ලොක් ගල්වල කුහර අතරින් ඉහළ අතට, සිරස්ව මිලි මීටර් 12 කම්බි මිලි මීටර් 400න් 400ට දාලා ඒ කුහරත් කොන්ක්‍රීට් (Reinforced Block Masonry) කළා. ජේසා වළලු යට මට්ටමේදී මේ බිත්ති නැවතිලා ඒ උඩ තිරස් අතට කොන්ක්‍රීට් ලෑල්ලක් දැම්මා. මේ ලෑල්ලත් බර උනුලා ගන්න පුළුවන් විදියට කම්බි දාලා (Reinforced) හැදුවේ පැති අටක් තියෙන්න. අර කුඹ ගහක් වගේ ඉහළට යන මැද කණුව මේ කොන්ක්‍රීට් ලෑල්ල කම්බිවලින් සම්බන්ධ කළා වගේම අත්තිවාරමේ වගේම අරියව එකට යා කරපු කොන්ක්‍රීට් බාල්ක (Beam) හතරකිනුත් සම්බන්ධ වෙනවා. දැන් පොළවත් බිත්ති කෑලි අටත් මේ ලෑල්ලත් අතර තියෙන්නෙ තකුහරයක්. (Void) ඒ මැද්දෙන් අර කණුව ඉහළට තියනවා. මේ ඔක්කොම එකම කොටසක් විදියට යා වෙලයි පාදම කොටස සම්පූර්ණ වුණේ. ඔය කොටසින් ඉහළට නගින්න කවුළුවකුත් ලෑල්ලෙ තියලයි හැදුවේ.

''අර කලින් තමුන්නැහේ කියපු සින්දුව අහන් ඉන් බැරි වුණාට මොකද මේ කතාව හං අපූරුයි.'' පින්, පනව උනන්දු කළා.

''කතාවනං ටිකක් දිග් ගැස්සුනා තමයි. ඒත් මේක එහෙම්පිටින්ම නොකිව්වොත් වටිනාකමක් නෑ. ඉතිරි ටික හොඳ හරිය.'' පන් ආතේ කතාවට මුල පිරුවා.

බුබ්බුලාකාර හැඩේට ගර්භය හදාගත්ත එක මයි ඊළඟ කාරිය වුණේ. පොල් කටුව වගේ ඇතුලින් කුහරය තියෙන්න කොන්ක්‍රීට්වලින් හදනකොට කම්බි ඉහළ ඉඳන් පහළට අරියව පොල් කටුවේ දාර වගේ විහිදෙන්න ගණන් බලලා සැළසුම් කළේ (Shell Theory) කියන න්‍යයාට අනුව බලය විහිදෙන හැටි ගණනය කරලයි.ටොන් 12ක් බර දේවතාකොටුවෙයි, කොත්කැරැල්ලයි රැඳුනේ ගරභය උඩ. ගර්භයේම බරත්, අර කියපු බරත් බෙදිලා, විහිදිලා ඇවිත් පාදමට එන විදියටයි ඒ ගණනය කිරීම (Computation) කෙරුණෙ. කොන්ක්‍රීට් හයිවෙනකල් රඳන්න ආධාරක තට්ටුවක් (Shuttering) එපායැ. ඒ තට්ටුව හැදුණෙ බොන්ඩෙක් (Bondek) කියන තුනී වානේ තහඩු (Steel Sheet) වලින්. ඇත්තටම ඒ තහඩු ස්ථිරවම කොන්ක්‍රීට් එකත් එක්ක තියෙන්න අරින නිසා කම්බිවලට අමතරව කොන්ක්‍රීට් ගර්භයට (Dome) හයියකුත් වෙනවා. නියම බුබ්බුලාකාර හැඩයට නවාගත්ත මිලි මීටර 100යේ 100යේ ''එල්'' යැඩයේ වානේ ගේඩර් (L. Angels) ඉහළ ඉඳන් පහළට අරියව පොල්කටුවේ දාරේ වගේ අමුණලා කරපු සැකිල්ලක් උඩයි අර තුනී තහඩු ඇතිරුවෙ. කොක්ක්‍රීට් වේලෙන්න කලින් ඒවායේ බරටම කඩා හැලෙන එක නවත්තන්නයි, ඉක්මනට හයි වෙන්නයි, ඉරි තලන එක වළක්වන්නයි, ශක්තිමත් වෙන්නයි ඕන කරන විශේෂ කොන්ක්‍රීට් මිශ්‍රණයක් මේ වැඩේට මෙන්ඩිස් මහත්තයා නිර්දේශ කළා. දරා ගැනීමේ බලය මෙගා පැස්කල් (MPa) 20ක් ඇති මිලි මීටර් 8 කුඩා ගල් යොදලා සිමෙන්ති පොඩ්ඩක් වැඩිපුර දමපු කොන්ක්‍රීට් මිශණයට ''සයිපෙක්ස්'' (Xypex) කියන රසායනික ද්‍රව්‍ය එක් කළා. කම්බි දැලෙන් පිටට කොන්ක්‍රීට් ආවරණය (Cover) මිලි මීටර් 30යි. මේ මිශ්‍රණය ගර්භයට යෙදුවෙ කොන්ක්‍රීට් විදින යන්ත්‍රයකින්. ලොකු පිඩනයකින් තහඩු තට්ටුවට කොන්ක්‍රීට් විදින එකට කියන්නෙ ''ෂොට්ක්‍රීට්'' (Shotcrete) කියලයි. සාමාන්‍යයෙන් කොන්ක්‍රීට් එකක් දැම්මම මතුපිට හොඳට මට සිළුටු කරගන්න මට්ටම් ලෑල්ල අල්ලනවා. ඒ වගේ ගර්භය මතුපිට මට සිළුටු කරගන්න විතරක් නෙවේ; නියම ගෝලාකාර හැඩේ හරියටම තියෙන විදියට සම්පූර්ණ කරගන්න යකට පට්ටවලින් යදපු ලොකු රාමුවත් ඒ හැඩේට යදා ගත්තා. ඒක ගැබේ ඉහලින් හයි කළේ යට කොටස කරකවන්න පුළුවන් වෙන්න. යරියට එක අණ්ඩක් කොට, පැන්සල හයිකරන අණ්ඩ කවාකර වුණ කවකටුවක් වගේ ගර්භයේ අරය මීටර් 3.35ක්. කොන්ක්‍රීට් කටුව මිලි මීටර් 150ක් ඝනකමයි. ගර්භය මුදුනේ දේවතාකොටුව තනාගන්න පහසු වෙන්න ඒ කොන්ක්‍රීට් එකටම යාව යතරැස් කොන්ක්‍රීට් වේදිකාවකුත් සැලසුම් වුණා.

''කොත්කැරැල්ලයි දේවතාකොටුවයි දෙකම එක කොටසක් විදියට බ්මයි හැදුවෙ.දේවතාකොටුව මිලිමීටර් 910ක් උසයි. කොත්කැරැල්ල මීටර් 3ක් විතර. දෙකේම බර ටොන් 12ක් වුණා. ටොන් 16ක් උස්සන්න පුළුවන් ලොඩකරයකිනුයි බිම ඉඳලා උස්සලා ගැබ මතුපිට හැදුන තිරස් මතුපිට උඩ තිව්වේ. දේවතාකොටුවේ කොන් හතරේ කොන්ක්‍රීට් වලට ගල්වපු සිරස් බට (VertiÊl Conduits) ඇතුලට අර වේදිකාවේ කොන්වලින් ඉහළට තියලා තිබුණ මිලි මීටර් 32 දගර වානේ කම්බි හතර (Starter bars) ඇතුල් කරලා සිමෙන්ති දියර (Grout) වලින් පිරෙව්වා. වේදිකාවෙ කොන්ක්‍රීට්වලට ගිල්වලා තිබුණ ඒ කම්බි හතරින් තමයි මීටර් 1.38 මීටර් 1.38 දිග පළල දේවතා කොටසත් ඒ උඩ එකට යාව හැදුව කොත්කැරැල්ලත් සම්බන්ධ කෙරෙනෙ. කොත්කැරැල්ලේ පහල විෂ්කම්භය මීටර් 1.033යි. මේ කොටස ඉහළට උස්සන්න දේවතා කොටුවේ පාත මට්ටමේ ඉඳන් කොත්කැරැල්ල හරහා ඒ මැදින් ඉහළට දම්වැලක් (Chain) හයි කරලයි තිබුණෙ. මේ තරම් බරක් ඉහළට දොඹකරයෙන් උස්සාගෙන ඉන්න අතරේ අර බට හතර හරියටම ඇතුල් කරලා තැන්පත් කරන එක ඒ තරම් ලේසි පහසු වුණේ නෑ. බර අඩු කරගන්න මේ කොටස් හැදුණෙ ඇතුලේ කුහර තියලා. ඉතින් දේවතා කොටවේ බිත්ති මිලි මීටර් 200ක් විතර වුණා. කොත්කැරැල්ල දේවතා කොටුවට සම්බන්ධ වුණ දේවතා කොටුවේ උඩ කොන්ක්‍රීට් ලෑල්ලක් (Slab) මිලි මීටර් 200ක් ගණක වුණා. මේ හැම කොටසකටම කම්බි කූඩු බැන්ද හැටි වෙනම කතාවක්. මෙන්ඩිස් මහත්තයා ගණනය කිරීම් විතරක් නෙවේ; වැඩ බිමේ පරීක්ෂාවන් (On site inspec-tion) ගොඩක් වැදගත් වුණා.

ජේසා වළලු හදන්න ඒ ඒ මට්ටම් තුනේදී ගර්භයේ කොන්ක්‍රීට් එක විදලා මිලි මීටර් 16 දගර වානේ කම්බි මිලි මීටර් 150ක් දුරින් ජේසා වළලු කොන්ක්‍රීට් වලට සම්බන්ධ කරන්න එළියටත් හිටින විදියට (Starter bars) ගිල්ලුවා. ඒවා සිමෙන්ති දියර (Grout) වලින් සවිමත් කලා. විමලධර්ම හාමුදුරුවෝ කියපු හරස්කඩේ හැඩයට නවාගත්ත අර්ධ කවාකාර යකඩ පට්ටම් ගැබට තාවකාලිකව සම්බන්ධ කරලා, ඒ පට්ටම් උඩට අර කලින් කිව්ව කම්බිවල එළියට තියපු කොටස් ගිල්වෙන විදියට කොන්ක්‍රීට් කරලයි ජේසා වළලු සම්පූර්ණ වුණේ. එක ජේසා වළල්ලක් කළාට පස්සේ ඒ යකඩ පට්ටම් ගලවලා අනික් ජේසා වළල්ල යදන්න යොදා ගත්තා.

''රුවනිවැලි සෑයේ සළපතලමළුව වගේ වඳින පුදන අයට මළුවත් චෛත්‍ය''පාදම වටේට ඉදි කෙරුණා. ඒ මළුව වටවුනේ වළා බැම්මකින්. කලින් කිව්වා වගේම දොරකඩට ඇතුලත් කෙරෙන හැම අංගයක්මත් හිටි පිළිම වහන්සේ නමකුත්, දොළොස් මහ පහණකුත්, බෝධිඝරයත් සම්පූර්ණ කරගන්න විමලධර්ම හාමුදුරුවෝ තමන්ගේ දැනුම, හැකියාව වගේම ශ්‍රමය දිවා රෑ දෙකේම ලබා දුන්නා. ඕක තමයි අර රජපසටහනේ කතාව. නරක නෑ නේද කෙරුවාව ?'' පන් කතාව ඉවර කළා.

''අනේ සාධු ! මේ කතාව මේ විදියට පැහැදිලි කරලා දුන්න මෙන්ඩිස් මහත්තයටත්, විපිත හාමුදුරුවන්ටත්, පොඩි හාමුදුරුවන්ටත්, ඒ ඒ නම්වුවල මහත්තුරු හැමෝටමත් අපි ස්තූතිවන්ත වෙන්න ඕන, ඒ වගේම මේ වැඩේට දායක වුණ හැමෝටම පින් පමුණුවන්න ඕන.'' පින් සාදුකාර දුන්නා.

සිසිර දිසානායක



සෑම සෙනසුරාදාම දහවල් මෙල්බන් වේලාවෙන්
1 සිට 5 දක්වා එෆ් එම් 97.4 ඔස්සේ
තිසර

රංජිත් රුක් සමග පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

නැවුම් පුවත් තාරවත් සඳා බහා
දෙස් විදෙස් කාලීන සිද්ධීන් ඊප්‍රුරද සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
බලන්න හඬ - ලක් හඬ

2007 සන්නස සාහිත්‍ය තරගාවලියේ මුල් තැන ගත් කෙටිකතා දහය



පළමුවැනි තෑග්ග
කෙටිකතා සංග්‍රහය
දැන් තැපෑලෙන් ලබා ගන්න
තැපැල් ගාස්තු සමග මිල
ඩොලර් 5
Sannasa News Group
22 Lorne Street Lalor Vic 3075
03 9402 5380